# අප්‍රිකානු සූකර උණ රෝගය (African Swine Fever) වළක්වා ගන්නා, ව්‍යාප්තිය පාලනය කර ගන්නා හා ගොවිපල නැවත ආරම්භ කර ගන්නා ආකාරය

<u>රෝගය රට තුල පැතිරී යන අවස්ථාවේ රෝගයෙන් ගොවිපල ආරක්ෂා කරගැනීම සඳහා,</u>

1. නිවැරදි ජෛව ආරක්ෂණ ක්‍රම අනුගමනය කිරීම හා පවත්නා ජෛව ආරක්ෂණ ක්‍රම තර කිරීම.
2. නව සතුන්, සත්ත්ව මාංශ හෝ ආසාදිත ලෙස සැක කළ හැකි ද්‍රව්‍ය ගොවිපල තුළට ඇතුළු කිරීම වැලැක්වීම.
3. ඉවතලන ආහාර / ඉඳුල් සතුන්ට ලබා දිමෙන් වැලකි සිටීම.
4. ආසාදිත ප්‍රදේශ වලින් සතුන් ප්‍රවාහනය සම්පූර්ණයෙන්ම නවතාදැමීම.
5. ගොවිපළවලට ඇතුල්වන වාහන සහ මිනිසුන් සඳහා විෂබීජහරණයට ක්‍රමයක් යෙදීම.

<u>රෝගය ව්‍යාප්තිය පාලනය කිරීමට සඳහා,</u>

1. ආසාදිත ගොවිපල නිරෝධායනය හා සතුන් හුදෙකලා කිරීම.
2. ආසාදිත සතුන් හැකි ඉක්මනින් ගොවිපල පරිශ්‍රයෙන් ඉවත් කිරීම.
3. මැරුණු සතුන් නිසි ක්‍රමවේද ඔස්සේ බැහැර කිරීම.
4. ගොවිපල පරිශ්‍රය නිසි ක්‍රමවේද ඔස්සේ විෂබීජහරණය කිරීම.
5. ජලාශ්‍රිත ස්ථානවල හෝ ජල මූලාශ්‍ර ආසන්නයේ මල සතුන් වැළලීමෙන් වැළකීම. (මෙම රෝගකාරක වෛරසය දීර්ඝ කාලයක් පරිසරයේ රැඳී පවතින බැවින් පරිසරයට වෛරසය එකතු වීමෙන් පසුකාලීනව රෝගය නැවත නිරෝගී ගොවිපල වලට ආසාදනය විය හැක).

<u>ආසාදිත සතුන් ගොවිපල පරිශ්‍රයෙන් ඉවත් කිරීම.</u>

- ආසාදිත සතුන් මානුෂිය ආකාරයෙන් (වේදනා රහිතව) විනාශ කිරීම සිදු කල යුතුය.
- මෙහිදී,
    1. ප්‍රබල විද්‍යුත් කම්පනයක් මගින්
    2. එක එල්ලේ හිසට වෙඩි තැබීම මගින් සතුන් විනාශ කල හැක.
- සත්ව මළසිරුරු හෝ අනෙකුත් සියලුම අසාදිත ද්‍රව්‍ය පූර්ණ දහනයට හෝ ගැඹුරු වල දැමීමකට ලක් කල යුතුය.
- දහනයට ලක් කරන ස්ථානය හෝ වල දැමීම සිදු කරන ස්ථානයට මල සතුන් හෝ අසාදිත ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ඒ සඳහාම වෙන් කල වාහන භාවිත කල යුතුය.
- ප්‍රවාහනයේදී අවට පරිසරයට එම රෝගකාරක එකතු වීමට ඇති හැකියාව අවම වන පරිදි මුද්‍රා තබා ප්‍රවාහනය කල යුතුය.
- මෙහිදී දිරාපත් වන අසාදිත ද්‍රව්‍ය ගැඹුරු වල දැමීමට හා දිරාපත් නොවන ද්‍රව්‍ය පූර්ණ දහනයටද ලක් කිරීම වඩා සුදුසුය.

❖ <u>මලසතුන් හෝ අසාදිත ද්‍රව්‍ය පූර්ණ දහනයට ලක් කරන්නේනම්,</u>

- සියලු කොටස් අළු බවට පත් වන තෙක් දහනය කළ යුතු අතර, අවසානයේ ඉතිරි වන අළු සියල්ල වල දැමීම සිදු කළ යුතුය.

❖ <u>මල සතුන් ගැඹුරු වල දැමීමකට ලක් කරන්නේනම්,</u>

- වල දැමීමට තෝරා ගන්න ස්ථානය ජල මූලාශ්‍ර වලින් ඈත්ව පිහිටි, ගංවතුර අවදානමට ලක් නොවන, වන සතුන්ගේ ග්‍රහණයට හසු නොවන, පොදු මහජනයාගෙන් ඈත්ව පිහිටි ප්‍රදේශයක් විය යුතුය.

- මල සතුන් හෝ ආසාදිත ද්‍රව්‍ය අළු හුණු අතුරන ලද ගැඹුරු වලවල් වලට දැමිය යුතුය. එම සිරුරු මතට පස් දැමීමට පෙරද අළු හුණු ස්ථරයකින් ආවරණය කල යුතුය.

- වල දමනු ලැබූ ද්‍රව්‍ය වලට ඉහළින් වසා දමන පස් තට්ටුවේ ඝනකම අවම වශයෙන් 0.6 m පමණ විය යුතුය.

<u>විෂබීජහරණය</u>

- මල සතුන් හෝ අසාදිත ද්‍රව්‍ය ගොවිපල පරිශ්‍රයෙන් ඉවත් කිරීමෙන් අනතුරුව තවදුරටත් අසාදනය විය හැකි ද්‍රව්‍ය ඉවත් වන පරිදි තවදුරටත් අතුගා / සූරා පිරිසිදු කල යුතුය.
- තවදුරටත් කාබනික ද්‍රව්‍ය ඌරු කොටු තුල පවතීනම්, ඝේදමකාරක ද්‍රව්‍යක් යොදා පිරිසිදු කර වියලා ගත හැක.
- ඉන් අනතුරුව විෂබීජ නාශක එක කර නියමිත කාලසීමාව තබා ගැනීමෙන් නිසි පරිදි විෂබිජහරණය කර ගත හැක.
  1. **Sodium hydroxide : 2%** විනාඩි **30** ක කාලයක්
  2. **Hypochlorite: 2% - 3% available chlorine** (ක්ලීවින්) විනාඩි **30** ක කාලයක්
  3. **Ortho-phenyl phenol: 3%** විනාඩි **30** ක කාලයක්
  4. වෛරසය විනාශවන විෂබීජ නාශකයක් (**Virkon**) භාවිතා කිරීම.
- මේ ආකාරයට ආසාදිත ගොවිපලවලට අයත් ඌරු නිවාස, ගබඩා, වාහන ඇතුළු අනෙකුත් උපකරණ සියල්ල විෂබිජහරණයට ලක් කළ යුතුය.
- මෙම රෝගය කිනිතුල්ලන් මගින්ද බෝ විය හැකි හෙයින් නිසි කිනිතුලු-නාශක බෙහෙත් යොදා පරිශ්‍රය පිරිසිදු කළ යුතුය.

<u>නැවත ගොවිපල ආරම්භ කිරීම</u>

- ගොවිපල ක්‍රමවත් පරිදි ජීවානුහරණය කර අවම දින 40 කට පසු (resting period) නැවත ආරම්භ කළ හැකිය.
- ගොවිපලේ ධාරිතාවයෙන් 10%ක් පමණ සතුන් පළමුව ඇතුළත් කළ යුතුය.
- සති 06 ගතවන තුරු සතුන්ගේ රෝග තත්ත්වයන් පිළිබඳ නිරන්තර අධීක්ෂණයට ලක් කළ යුතුය.
- සති 06 කට පසු මුලින් ඇතුලත් කල සතුන් රෝගී ලක්ෂණ නොපෙන්වන්නේ නම් තවත් සතුන් අවශ්‍ය ප්‍රමාණයකට ඇතුළත් කළ හැකිය.
- මෙම නව සතුන් රෝගය අසාදිත නොවන ප්‍රදේශ වල ගොවිපල වලින් පමණක් ලබාගත යුතු වේ.
- නැවත සතුන් ඇතුලත් කල පසු ගොවිපල නිවැරදි ජෛව ආරක්ෂණ ක්‍රම යටතේ පවත්වාගෙන යා යුතු අතර, ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලය සමග මනා සන්නිවේදනයක් පවත්වා ගත යුතුය.
- ගොවිපළ ලියාපදිංචි ගොවිපළක් ලෙස නිසි ක්‍රමවේද ඔස්සේ පාලනය කළ යුතුය.

- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව -